

# දඹුලු ගොවිං තලගොයි මැරුවා නේද !

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ මාතලේ නගරයේ සිට කිලෝමීටර් හතලිස් අටක් දුරින් පාර අද්දරම විසිතුරු ගල්තලාවක් මත රන්ගිරි දඹුලු විහාරය පිහිටා ඇත. මෙහි ලෙන් විහාරය ප්‍රධාන ලෙන් පහකින් යුක්තය. පරිවාර ගල්ලෙන් සීයකට වඩා ගල්තලාව පුරා කැළෑව මැද විසිරී ඇත. ද්‍රවිඩයන් අතින් පැරදී කාලයක් වනගතව ජීවත් වූ වළගම්බා රජු දඹුල්ලේ සැඟවී ජීවත් වූ බව කථාවල කියවෙයි. මහාවංශය කියන 'වෙස්සගිරිය' යනු දඹුලු විහාරය බව සංස්කෘතික දෙපාර්තමේන්තුවේ වෙසක් කලාපයකට ඉංග්‍රීසි භාෂාවෙන් ලිපියක් සපයමින් මහාචාර්ය පරණවිතාන පෙන්වා දෙයි. දඹුල්ල ස්වභාවධර්මයේ අතිශය චමත්කාරජනක නිර්මාණයකි.

පොළොන්නරුවේ රජකළ නිශ්ශංකමල්ල රජු (1153-1187) වරක් දඹුලු විහාරයේ බුදුපිළිමවල රත්රන් ආලේප කළ අතර ඉන් පසුව එම විහාරය 'රන්ගිරි දඹුල්ල' නමින් ප්‍රසිද්ධ විය. දඹුල්ල විජයාවතරණය කාලයටත් වඩා පැරණි ශිෂ්ටාචාරයක් පැතිර තිබූ බිමක් බව දඹුල්ලේ ඉබ්බන්කටුවට නුදුරු ඇවරියපතහ, ගලේවලට නුදුරු වේලිය කන්ද යන ප්‍රාග් මානව සුසාන භූමිවලින් පෙනී යයි.

වටවන්දනාවේ ගිය පැරණි සිංහලයන්ගේ වැදගත් පූජා භූමියක් වූයේ රන්ගිරි දඹුල්ලයි. දඹුල්ල ප්‍රධාන ගල්ලෙන තුළ දැවැන්ත සැතපෙන බුදුපිළිමය හා ගල්ලෙන මුදුනින් පාත්‍රයට එකතු වන ජල බින්දු වැදගත් වෙයි.

දඹුල්ල විහාරයේ චිත්‍ර ඇන්දෙත් ගලේවල නුදුරුව ජීවත්වන නිලගම සිත්තර පරපුරයි. සීගිරි චිත්‍ර නිර්මාණය කළේද මෙම නිලගම සිත්තර පරපුර බව ජන විශ්වාසයයි. ගලේවල සිට සැතපුම් පහක් පමණ ගිය විට නිලගම විහාරය අසල මේ පැරණි චිත්‍ර පරපුරේ අය ජීවත් වෙති. වරක සීගිරි චිත්‍රවල කළුතෙල් ගා විනාශ කළ විට ඒ චිත්‍ර සකස් කිරීමට පැමිණි ඉතාලි චිත්‍ර ශිල්පි ලුසියානු මරන්සි පැරණි චිත්‍ර ඇඳි වර්ණ ගැලපීමට නිලගම පරපුරේ ශිල්පීන් හමු වී කාලයක් ඒ තොරතුරු හැදෑරීය. මෑත කල දඹුලු විහාරයෙහි බුදු පිළිම, චිත්‍ර සකස් කළේ කීර්ති ශ්‍රී රාජසිංහ රජු (1742-1782) කල නිලගම සිත්තර නයිදේය

දඹුලු ගොස් තලගොයි මැරීම සිංහල ජනවහරේ ප්‍රකට කියමනකි. මෙයින් අදහස් කළේ අහිසංක සතෙකු වූ තලගොයා මැරීමක් නොවේ. ඉන් එහා ගිය යටි අර්ථයකි. දඹුල්ල තෙත් කලාපය හා වියළි කාලපය මායිමේ පිහිටි වියළි කලාපයට අයත් තැනිතලා බිමකි. එදා මේ තැනිතලා බිම මුළුමනින්ම කැළෑවෙන් වැසී තිබූ අතර එහි වී වගාව, ගොඩ වී ඉසීම, හේන් ගොවිතැන බහුලව සිදුවිය. වන සතුන් බහුල කැළෑවේ හේන් වගා කළ ගොවියෝ පහළට එල්ලෙන ලී ඉනි මඟක් දිගේ ශක්තිමත් ගසක බැඳ ඇති පැලක සීපද කියමින් කාන්සිය මකා ගනිමින් හේන් රැකීම සිරිත විය. එම හේන්වල ගොඩ වී, කුරක්කන්, බඩඉරිඟු, තල, අමු, මෙනේරි, කැකිරි, වට්ක්කා, අබ කොටස් ලෙස හෝ මිශ්‍රව වැපිරීම සිරිත විය. 'නවදැලි හේන්' යනු විශාල දැව කඳන් කපා ශක්තිමත් දඬු වැට බැඳ ඒ මැද බෝග වර්ග නවයක් හෝ එයට වඩා මිශ්‍රව වැපුරූ හේන්ය.

එවැනි මිශ්‍ර බෝග වගාව නිසා හේන් සරුසාර විය. කෘමි රෝග මර්දනය විය. මේ හේන්වල තනිකර හෝ මිශ්‍රව බහුල වශයෙන් තල වපුරන ලදී. තල එදා සිංහලයාගේ ආහාරයේ ප්‍රධාන අංගයක් විය. ආහාර බැදීමට ගත් තල තෙල් ව්‍යාංජන රසවත් කළේය. අවුරුදු කාලයට උත්සව වලට තල, මිශ්‍ර කිරිබත්, තල අළුවා, තල මිශ්‍ර කැවුම් සකස් විය. නෑමේදී මෙන්ම හිසට දැමීමට තලතෙල් භාවිතා විය. විශේෂයෙන් දඹුලු විහාරය මෙන්ම ජය ශ්‍රී මහා බෝධියට නිල් පාට තල මල් පිපෙන කාලයට තල මල් පූජාව එදා වැදගත් පිංකමක් ලෙස සලකා ඇත. ජය ශ්‍රී මහා බෝධියට තල මල් පූජා කළවිට ඊළඟ අවුරුද්දේ තල අස්වැන්න සාර්ථක වන බව ගැමියෝ විශ්වාස කළහ. දඹුල්ල ගල්තලාව පාමුල වන්දනාකරුවන් සඳහා විසිතුරු භාණ්ඩ, තල, එළවළු, පලතුරු අලෙවි කළ අවට ගොවියෝ එදා දඹුල්ලේ දැවැන්ත ගස් යට සෙවනේ තම නිෂ්පාදන වන්දනාකරුවන්ට විකුණූ බව පෙනී යයි. මේ භාණ්ඩ අතර තල ඉතා වැදගත් විය. අද දඹුල්ල අසලම කුරුණෑගල පාරේ 'තලකිරියාගම' නමින් ගම්මානයක් ඇත. අතීතයේ එය දඹුලු විහාරය අසළම පැතිරී තිබූ ගමක් බව පෙනී යයි. අද කැළෑව පැතිරීමෙන් ගම ඈත් වී ඇත. තලකිරියාගමට ඒ නම ලැබුණේ තල ගොවීන් තල වවා දඹුල්ල වන්දනාවේ එන අයට බහුලව තල අලෙවි කළ බැවිනි. දඹුලු වන්දනාවට එන අය එහිදී අඩු මුදලට ගිය ගමන සිහි වීමට තල ආපසු ගමට ගෙන ගිය බව පෙනී යයි. මෙසේ අඩු මිලට ගොවීන්ගෙන් තල මිලදී ගැනීම තලගොයි මැරීම යනුවෙන් පසුව ප්‍රකට විය. ඉන් අදහස් කළේ ගොවීන් හෙට්ටු කර අඩු මිලට තල මිලදී ගැනීමයි. වන්දනාවේ ගොස් මිලදී ගත් තල අවුරුදු දෙක තුනක් ගම්මු කැවිලි සෑදීමට භාවිතා කළහ.

ගලේවල සිට මාදිපොළ පාරේ තලකිරියාව නමින් තවත් පැරණි ගම්මානයක් ඇත. ගලේවල නුදුරු අකුරම්බොඩ 'තල වත්ත' නමින් තවත් ගමකි. විශේෂයෙන් මහනුවර යුගයේ රජකළ ද්‍රවිඩ නායක්කාර රාජයුගයේදී තල වගාව හා තලතෙල් සඳහා වැඩි ඉල්ලුමක් මහනුවර නගරයෙන් දඹුල්ලට ලැබුණු බව පෙනෙයි. මාතලේ දිස්ත්‍රික් සීමාව කෙළවරේ මඩාටුගම හා කැකිරාව අතරතුර පැරණි ක්‍රමයට ගවයින් යොදා සෙක්කුවල තලතෙල් සිඳින ද්‍රවිඩ පවුල් හැටක් පමණ පදිංචි 'සෙක්කුවත්ත' නැමැති ද්‍රවිඩ ගම්මානය පිහිටා ඇත. සෙක්කුවත්ත ගමේ සිඳී තල තෙල් මහනුවර රජවාසලටත් උඩරට වන්දනාකරුවන් අතරත් බහුලව පැතිරී ගිය බව සිතිය හැක. ගැමියෝ පිටතින් එන වන්දනාකරුවන්ට තල ඇට අලෙවි කළ අතර සෙක්කුවත්ත ගමේ තලතෙල් ඇඟ ගැල්වීමට, හිසට දැමීමට, ඖෂධ පිණිස, පහන් දැල්වීමට අලෙවි විය. මේ අනුව දඹුලු වන්දනාවේ ගිය අය දඹුල්ල පසුකර වෙනත් වට වන්දනාවේ ගිය අය සිහිවටනයක් ලෙස දඹුල්ලෙන් අඩු මිලට තල මිලදී ගැනීම 'තලගොයි මැරීමක්' ලෙස පසුකල වැරදි ව්‍යවහාරයෙන් වැරදි අර්ථකතනයක් දෙන පිරුළක් බවට පත් වී ඇත. එහෙත් අද හේන් වගාව සීමාවීම නිසා දඹුල්ල අවට තල වගාව බෙහෙවින් සීමා වී ඇත. අද සෙක්කුවත්තේ පාරම්පරික ජනයා වෙනත් නගරවලට ඇදී යමින් පවතියි. දැන් ඉතිරිව ඇත්තේ තල සෙක්කු කීපයක් පමණකි.

**ගොවිකම් සඟරාව රසවත් කළේ,**

**එස්. කේ. ජයවර්ධන**

**වත්තේගම හිටපු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ**